# ශ්‍රී ලංකාවේ චේතියඝර සංකල්පයේ ආරම්භය හා වර්ධනය

ඩබ්.එම්. චින්තක සඳරුවන්

## ප්‍රවේශය

ශ්‍රී ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පය පුළුල් වූ ක්ෂෙත්‍රයක් පුරා විසිර යන්නකි. ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවසේ සිදුවන මහින්දාගමනය මෙයට බෙහෙවින්ම දායක වූ බව අවිවාදයෙන් පිළිගන්නා කරුණකි. එබැවින් මෙරට ගෘහ නිර්මාණ සම්ප්‍රදායන් බිහිවීමේ දී යම් ඉන්දීය ආභාසයක් හඳුනාගැනීමට හැකියාව ලැබේ. මහින්දාගමනයත් සමඟ මෙරට භික්ෂු භික්ෂුණී පරපුරක් ආරම්භ වන අතර උන්වහන්සේලාගේ පහසුව සඳහා විවිධාකාර වූ ගෘහ නිර්මාණ අංග ඉදිවිය. එහි ආරම්භක අවස්ථාව වන්නේ ගල් ලෙන් භාවිතයෙන් විහාරාරාම නිර්මාණය කිරීමයි. පසුව ස්තූප, චේතියඝර, බෝධිඝර, ආසනඝර, උපෝසතඝර, පංචාවාස, ප්‍රතිමාඝර, දානශාලා, ජන්තාඝර ආදී නිර්මාණ මෙන්ම භික්ෂු, භික්ෂුණීන් වහන්සේලාගේ අවශ්‍යතා සපුරන විවිධ වූ ඉදිකිරීම් නිර්මාණය කළ බව හඳුනාගත හැකි වේ. කෙසේ වෙතත් මෙහි දී කථාබහට ලක් කිරීමට බලාපොරොත්තු වන්නේ ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පයේ වැදගත් නිර්මාණයක් ලෙස හඳුනාගත හැකි චේතියඝර පිළිබඳව වේ. මෙම වාස්තුවිද්‍යාත්මක නිර්මාණය පැවිදි පිරිස්ගේ පරිහරණය සඳහා නොව පූජනීය අංගයක් ලෙස නිර්මාණය කර ඇත.

## විමර්ශනය



වටදාගෙයක පියස්සෙහි

මෙරට බෞද්ධයන් විසින් චේතියඝර යනුවෙන් හඳුන්වනු ලබන ගෘහ නිර්මාණය නැතහොත් වාස්තුවිද්‍යාත්මක අංගය හැඳින්වීම සඳහා සුලභව භාවිතයට ගනු ලබන්නේ වටදාගේ ලෙසිනි. වටදාගෙය ලෙස මෙහි දී හඳුන්වන්නේ ධාතු තැම්පත් කර ඉදිකරන ලද ගෘහයක් වටා ගොඩනැගුණු ගෘහයකට ලෙස සරලව පැහැදිළි කළ හැකි වේ. එසේම මෙය සංස්කෘත භාෂාවෙන් 'ධාතු ගෙය' ලෙසත්, සිංහල භාෂාවේ දී 'දා ගෙය' ලෙසත් හඳුන්වනු ලැබේ. මෙම කරුණ පිළිබඳව විමසිලිමත්ව බැලීමේ දී ධාතු තැම්පත් කර ගොඩනගන ලද ස්ථූපයන් වටා ලංකාවේ දී චේතියඝර හෙවත් වටදාගෙය නිර්මාණය වූ බව හඳුනාගත හැකි වේ. චේතියඝර, වටදාගේ, චෛත්‍යඝර, ස්ථූපඝර, ථූපඝර, චෛත්‍යශාලා, ආදී නාමයන්ගෙන් මෙම වාස්තුවිද්‍යාත්මක ගෘහ නිර්මාණය හැඳින්වීම තුළින්ම මේ බව අවබෝධ කර ගැනීම අපහසු නොවේ. ඒ අනුව ස්ථූපයේ ආරක්ෂාව සඳහා ඉදිකරන ලද ගෘහය ඉහත නාමයන්ගෙන් හඳුන්වා ඇති බව පැහැදිලිය. දාගැබ ධාතූන් වහන්සේලා තැම්පත් කළ ගෘහයක් බැවින් එහි ආරක්ෂාව සඳහා චේතියඝර මෙරට කලාකරුවා නිර්මාණය කළ බව දැකගත හැකි වේ. එහෙත් මෙම අංගය ආරක්ෂක අංගයක් ලෙස මෙන්ම කලා අංගයක් ලෙස ද කථාබහට ලක්වේ.

## චෛතියඝර සංකල්පයේ ආරම්භය



අවුරංගබාද් ලෙන

චෛතියඝර සංකල්පය මෙරට ආරම්භ වූවක් නොවන බව ඇතැමුන්ගේ අදහස වේ. චෛතියඝර ඉන්දීය අශෝක යුගයේ දී නිර්මාණය වූ බවට සාධක පවතී. ගඩොලින් හා දැවයෙන් බයිරාත්හි තනා ඇති කවාකාර ස්මාරකය චෛතියඝර ස්වරූපයක් ගන්නා බව ඇතම් වාස්තුවිද්‍යාඥයින්ගේ අදහස වේ. එහෙත් එහි සාධක ප්‍රමාණවත් නොවන බැවින් එම අදහස පිළිගැනීම ඉතා අපහසුය. ක්‍රිස්තු පූර්ව 2 වැනි ශතවර්ෂයේ දී ඉන්දියාවේ ඉදි කරන ලද 'භජාහි' ගුහා විහාරය ද ගුප්ත යුගයේ ශිව දෙවියන් වෙනුවෙන් ඉදි කර ඇති 'චෙර් ශාලා' හා ටෙර්හි චෛතියඝරය ද මෙම ගොඩණැගිලි නිර්මාණ සම්ප්‍රදායේ ආරම්භක අවස්ථාවක් වන්නට ඇති බව අනුරාධ සෙනවිරත්න අදහස් දක්වයි. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව 2 වැනි සියවසේ සිට ඉන්දියාවේ චෛතියඝර නිර්මාණය වූ බවට සාධක පවතී. ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවස වන විට මෙරට සිදුවන මහින්දාගමනයත් සමග සංස්කෘතික දායාද ගණනාවක් මෙරටට උරුම වන අතර ඒ හරහා පසුකාලීනව මෙරට සංස්කෘතියට චෛතියඝර ද එක් වූ බව සිතිය හැකි ය.

## චෛතියඝරයක නිර්මානාත්මක ලක්ෂණ



එල්ලෝරා ලෙන

ක්‍රිස්තු පූර්ව යුගයේ නිර්මාණය කරන්නට යෙදුණු මෙම වාස්තුවිද්‍යාත්මක ඉදි කිරීම විවිධ ආකෘති කිහිපයක් අනුව ඉදිකර ඇති බව හඳුනාගත හැකි වේ. එනම්,

01. වෘත්තාකාර
02. අපීසාකාර
03. ආයත චතුරස්‍රාකාර



අජන්තා ලෙන

හයිරාත් හා දකුණු ඉන්දියාවේ සාලිහුන්දායි හා ජුන්නාර් වලින් වෘත්තාකාර හැඩයේ චෛතියඝර ද අපීසාකාර හැඩයේ චෛතියඝර බටහිර ඉන්දියාවෙන් ද ආයත චතුරස්‍රාකාර හැඩයේ බිම් සැලසුම් අජන්තාහේ හා එල්ලෝරාවේ දී දැකගත හැකි බව බස්නායක අදහස් දක්වා ඇත. ඔහු තවදුරටත් විස්තර කරන පරිදි බටහිර ඉන්දියාවෙන් හමුවන අපීසාකාර චෛතියඝර ආකෘතිය පිහිටි ලෙන්වල නිර්මාණය කර ඇති බවත් එම ලෙන් පද්ධති ද තවත් ආකෘති තුනකින් යුක්ත වන බවත් දක්වයි. එනම්,

01. අර්ධ කවාකාර ලෙන්
02. අඩ කෝනාකාර
03. ආයත කවාකාර

මෙම හැඩයන්ගෙන් යුත් චෛතියඝර බිම් සැලැස්ම සකසා ඒ වටා කුළුණු තනා ඒ මත අපීසාකාරයට පියස්ස තනා ඇති බව දක්වයි. පළමු හැඩයේ ආකෘති බටහිර ඉන්දියාවේ ද, දෙවන හැඩයේ ආකෘති තක්ෂිලාවේ ද, තෙවන හැඩයේ ආකෘති අජන්තා හා අවුරංගබාද් ප්‍රදේශවල දැකගත හැකි බව ඔහුගේ අදහස වේ.

## ශ්‍රී ලංකාවේ චේතියඝර සංකල්පය

වටදාගේ නිර්මාණය වීමේ වැඩි බලපෑමක් ඉන්දීය 'ගුන්තු පල්ලි' නම් ස්ථානයේ චෛත්‍යශාලාව බලපාන්නට ඇති බව බොහෝ උගතුන්ගේ මතය වේ. ඉන්දිය මෙම ආකෘති මුලික වශයෙන් පිහිටි ගල් භාවිත කර සිදු කළ ද ලාංකීය කලාකරුවා එය ස්ථූප වටා ඉදිකළ ගෘහයක් ලෙස විකාශනය කළ බව දැකගත හැකි වේ. මුල් යුගයේ මෙරට ඉදි වූ චේතියඝර දැවයෙන් නිර්මාණය කළ ඒවැ යැයි සිතිය හැකි වේ. පහත භාගය මැටියෙන් හෝ ගලින් නිමවා උපරිබාගය දැවයෙන් නිම කරන්නට ඇත. එහෙත් පසුකාලීන වන විට දැව කණු භාවිතය ඉවත් කර ඊට ගල් කණු ආරෝපණය කර වහළය උළුවලින් වසන්නට ඇතැයි උපකල්පනය කළ හැකි වේ.

ඉන්දියාව ආශ්‍රයෙන් බිහිවන චේතියඝර සංකල්පය ලංකාවට පැමිණියේ කිනම් කාලයක දී ද යන්න නිශ්චිතව සඳහන් කළ නොහැකිය. මහාවංශය දක්වන පරිදි වසභ රාජ්‍යය යුගයේ (ක්‍රි.පූ. 67-111) දී චේතියඝරයක් නිර්මාණය වූ බවට සාධක සඳහන් වේ. එහෙත් පරණවිතානයන් දක්වන පරිදි චේතියඝරවල ආරම්භය ක්‍රිස්තු වර්ෂ 7 හෝ 8 වැනි සියවස් දක්වා ගමන් කරන බවත් ඒ පිළිබඳව පුරාවිද්‍යාත්මක සාක්ෂි ද පවතින බවත් දක්වයි. මෙහි විශේෂ ලක්ෂණය වන්නේ ඉන්දියාව තුළ දී චේතියඝර සම්ප්‍රදායේ ආරම්භය සනිටුහන් වුවත්, මෙරටට කුමන යුගයක දී චේතියඝර ආරම්භය සිදු වූවද මෙරට කලාකරුවාට අනන්‍ය ලෙස මෙම වාස්තුවිද්‍යාත්මක අංගය නිර්මාණය කර ගත් බව දැකිය හැකි වීමයි.



ථූපාරාමයේ චේතියඝරයේ සාධක (1900 දශකය)

මෙරට චේතියඝර නිර්මාණයේ ආරම්භය පෙර දැක් වු ලෙස වසභ රාජ යුගයට (ක්‍රි.පූ. 65-109) දක්වා දිවයයි. දේවානම්පිය තිස්ස රජු (ක්‍රි.පූ. 250-210) විසින් නිර්මාණය කරන ලද ථූපාරාම ස්තූපය අරභයා මොහු විසින් දා ගෙයක් නිර්මාණය කළ බව මහාවංසයේ තිස්පස්වන පරිච්ඡේදයේ සඳහන් කරයි. එහි සාධක දැනුදු ථූපාරාමය ස්ථූපය ආශ්‍රයෙන් අපට හඳුනාගත හැකි වේ. එසේම මෙම රාජ්‍යය යුගයේ දී තවත් චේතියඝරයක් නිර්මාණය කළ බවට සාධක හමු වේ. එනම් මහාවංසය සඳහන් කරන පරිදි රජුගේ පුත්තා නම් මහේෂිකාව විසින් චේතියඝරයක් නිර්මාණය කළ බව සඳහන් වේ. **''ඒ රජහුගේ ප්‍රසිද්ධ වූ බිසව් බෝ මළුවෙහිම සිත්කළු වූ වෘත්ත නම් සෑයෙක් දා සෑ ගෙය ද කරවීය''**[1]



මිහින්තලයේ අම්බස්තල
චේතියඝරයේ සාධක (1900 දශකය)

1 මහාවංශය (ප්‍රථම භාගය), ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1996), පරි,35: 90-91 ගාථා.

එසේම මෙම රාජ්‍යය යුගයෙන් පසු කුඩා ප්‍රමාණයේ ස්ථූප ඇසුරෙන් චේතියඝර නම් වාස්තුවිද්‍යාත්මක නිර්මාණය ඉදිවනු දැකගත හැකි වේ. එසේම ලජ්ජතිස්ස රාජ්‍යය (ක්‍රි.පූ. 119-109) සමයේ දී ද ථූපාරාමය අරභයා ගලින්ම දා ගෙයක් කළ බව ද සඳහන් වේ. මෙරට චේතියඝර නිර්මාණය වීම පිළිබඳ විකාශනයක් මූලාශ්‍රය සාධක පරිශීලනයෙන් පැහැදිළිව හඳුනාගත හැකි වේ.

01. දේවානම්පියතිස්ස රජු (ක්‍රි.පූ. 250-210) ඉදි කළ ථූපාරාම ස්ථූපය සඳහා වසභ රාජ්‍ය යුගයේ (ක්‍රි.පූ. 65-109) පියස්ස සහිත ථූපඝර සැලැස්මක් සකස් කිරීම,

02. ගෝඨාභය (ක්‍රි.ව. 253-266) ථූපාරාමය ප්‍රතිසංස්කරණය කිරීම හා අම්භස්ථලය හා මනිසෝම යන ස්ථානවල චෛත්‍යගෘහ නිර්මාණය කිරීම.

03. දෙවන අග්බෝ රාජ යුගයේ (ක්‍රි.ව. 575-608) ථූපාරාම චේතියඝරය නැවත ප්‍රතිසංස්කරණය කිරීම.

04. මානවම්භ (ක්‍රි.ව. 684-718) හා හයවැනි අග්‍රබෝධි (ක්‍රි.ව. 733-772) නැවත ථූපාරාම චේතියඝරය ප්‍රතිසංස්කරනය කිරීම.

ඒ අනුව පැහැදිලි වන්නේ චේතියඝර වර්ධනය ඉතා සීඝ්‍රයෙන් සිදු වූවක් බවයි. මුල් යුගයේ දී පැවති අංගයන්ට වඩා වැඩි අංගයන් ප්‍රමාණයක් පසුකාලීන වනවිට එකතු වූ බවත් එය වටදාගේ ලෙසින් වෙනසකට ලක් වූ බවත් හඳුනාගත හැකි ය. ඒ අනුව ලංකාවේ විවිධ යුගවල දී චේතියඝර නිර්මාණය වූ බවට සාධක ගණනාවක් වංසකථා සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක සාධක තුලින් අනාවරනය කර ගැනීමට හැකියාව පවතී. ඒ අතර පහත ඒවා විශේෂ වේ.

- ථූපාරාමය චේතියඝරය
- ලංකාරාම චේතියඝරය
- මිහින්තලේ අම්බස්තලය චේතියඝරය
- තිරියාය වයදාගේ
- මැදිරිගිරිය වටදාගේ
- පොළොන්නරුව වටදාගේ
- අත්තනගල්ල විහාර වටදාගේ
- මැනික්දෙන වටදාගේ
- හස්තිකුච්චි චේතියඝරය

ආදිය එහි දී වටා වැදගත් චේතියඝර ලෙස දැක්විය හැකිය.

**චේතියඝර නිර්මාණ ස්වරූපය හා වාස්තුවිද්‍යාව**

චේතියඝරය යන්න ස්තූපයක් මධ්‍යය කර ගෙන බිහි වූ පරිපූර්ණ වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් ලෙස දැක්විය හැකි වේ. මෙම නිර්මාණය පසුකාලීන වන විට සැදැහැවතුන්ගේ ශ්‍රද්ධා භක්තිය හේතුවෙන් වර්ධනය වන්නට ඇත. ස්ථූපය උදෙසා වූ ගෞරවයත්, ස්ථූපයට ස්වාභාවික උවදුරුවලින් සිදුවන හානිවලින් ආරක්ෂා කර ගැනීමත් උදෙසා ගෘහයක් අලුතින් එක්කල බව සිතිය හැකි වේ. එය මූලාශ්‍රය සඳහන් කරන පරිදි පියස්සක් සහිත ගෘහයක් විය. ඒ අනුව නිර්මාණය වූ සෑම චේතියඝරයක්ම පොදු වූ ලක්ෂණ කිහිපයකින් යුක්තව ඇත.

1. වටකුරු මළුව
2. බාහිර කුළුණු වටය ඇතුලත පිහිටි ගඩොල් බිත්තිය
3. ගල් කණු පේළි
4. ඒවටා මැදි වූ ස්ථූපය



ලංකාරාමයේ චෛතියසරයේ සාධක (1900 දශකය)

බොහෝමයක් චෛතියසර මළුව වටකුරු ස්වාභාවයක් ගනී. එහෙත් රාජාංගනය හස්තිකුච්චි විහාරයේ හතරැස් ආකාරයේ මළුවක් පවතී. චෛතියසරය සඳහා ගල් කණු යොදා ගැනීමේ දී ගල් කණු පේලි අතර සම්මත ප්‍රමාණක් දැකගල නොහැක. එය ගල් කණු පේලි දෙකක්, තුනක් හෝ හතරක් වශයෙන් වෙනස් විය හැකි ය. ගල් කණු පේලි හතරකින් යුක්ත චෛතියසරයක් ලෙස ථූපාරාමයත්, ගල් කණු පේලි තුනකින් යුක්ත චෛතියසර ලෙස ලංකාරාමය, පොළොන්නරුව හා මැදිරිගිරිය වටදාගෙවල් ද ගල් කණු පේලි දෙකකින් යුක්ත චෛතියසර ලෙස තිරියාය, අම්බස්තලය, අත්තනගල්ල චෛතියසර ද දැක්විය හැකි වේ. මෙහි දී පොළොන්නරුවේ වටදාගෙයි ගල් කණු පේලි තුනට අමතරව දැව කණු පේලි තුනක් ද පවතී බවට සාධක හඳුනාගත හැකි වේ.



තිරියාය වටදාගේ

ලංකාවේ ඉදිකළ ප්‍රථම චෛතියසරය වන්නේ ථූපාරාම ස්ථූපය සඳහා ඉදිකළ චෛතිසරය වේ. මෙහි ස්ථූප මළුව අඩි 59ක විශ්කම්භයකින් යුක්ත වන අතර සථූපය වටා ඒක කේන්ද්‍රියට දිවෙන ගල් කණු පෙළවල් හතරක් දැකිය හැකි වේ. එසේම මෙම ස්ථූප මළුව මහල් දෙකකින් යුක්ත වේ. එහි ඇති ගල් කණුවල පහල කොටස හතරැස් වන අතර ඉහලට යාමේ දී අෂ්ටාකාර වීම විශේෂිතය. දැනට මෙහි පළමු කවයේ ගල් කණු 52ක් ද, දෙවන කවයේ ගල කණු 36 ක් ද, තෙවන පෙළ ගල කණු 40ක්

ද සිව්වන පෙළ ගල් කණු 48ක් ද ශේෂ වී ඇති අතර එම ගල් කණු උසින් අඩි 22යි අගල් 10 සිට අඩු වී ගොස් ඇත. වෙන් වෙන් වශයෙන් නෙලන ලද කුළුණු හිස් කුඩුම්බි මාර්ගයෙන් කුළුණු කඳට සවිකර ඇත. ලංකාරාම චෛතියඝරයේ ද ථූපාරාමයට සමාන සැලැස්මක් දැකගත හැකි වේ. එහෙත් මෙහි ඇත්තේ ගල් කණු පෙළ තුනක් පමණි. මෙහි කුළුණු හිස් ථූපාරාමයේ කුළුණු හිස්වලට සමාන වුවත් කුඩුම්බි හෝ එලකයන්ගෙන් සමන්විත නොවේ. මිහින්තලය අම්බස්තල ස්ථූපයේ චෛතියඝරයේ සැලසැස්ම වර්තමාන ප්‍රතිසංස්කරණ නිසා බොහෝ දුරට වෙනස් ව ඇත. එහෙත් මෙහි ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ කණු පෙළ දෙකකින් යුක්ත වීමත් එම කණු පෙළවල් දෙක උසින් සමාන වීමත්ය.



මැදිරිගිරිය වටදාගේ

ලංකාවේ චෛතියඝර සංකල්පයේ හොඳම නිර්මාණය වන්නේ මැදිරිගිරිය වටදාගේ වේ. සිව් වැනි අග්‍රබෝධි රජු (ක්‍රි.ව. 667-683) පාලනය කරන සමයේ මලය රාජ නම් පාලකයෙකු මෙම ප්‍රදේශයේ දාගෙයක් කළ බව සඳහන් වන අතර එය වත්මන් මැදිරිගිරිය වටදාගේ ලෙස උපකල්පනය කරයි. උස්ගල් තලාවක් මත ඉදිකර ඇති මෙම වටදාගෙය අඩි 26 ක පමණ විශ්කම්භයකින් යුතු ස්ථූපයක් දරා සිටි. සෙනරත් පරණවිතානයන් මෙහි සිදු කළ කැණීමක් අනුව වටදාගෙට වඩා පැරණි අවුරුදු 600ක් පමණ ස්ථූපයක සාධක මේ මත හමුව අත. මෙහි ජේසා වළළු වෙනුවට හිරිගලින් ඉදිකල බොරදම් වට දෙකක් දැකිය හැකි වේ. පියස්ස සවි කිරීම සඳහා යොදාගත් ගල් කණු පෙළ 3කින් යුක්ත වන අතර උසින් අඩි 17ක් පමණ වේ. මෙහි කුළුණු හිස් තවමත් නොවැටී අදටත් දැකගල හැකි වේ. කුළුණු හිස් වෙනම සකසා සවිකර ඇති අතර එහි හිස් හංස හා වාමන රූපයන්ගෙන් කැටයම් කර ඇත.

1887 දී එච්.සී.පී. බෙල් මහතා විසින් මුලින්ම මැදිරිගිරිය වටදාගේ සොයාගන්නා ලදී. එසේම මෙය වර්තමාන තත්ත්වයට ගෙන ඒම සඳහා සංරක්ෂණ කටයුතු 1942දී ආරම්භකර අවසන් කිරීමේ ගෞරවය හිමි වන්නේ සෙනරත් පරණවිතානයන්ට වේ. මෙහි ඉහලට පියස්සක් නොවූ බව පර්ගසන් හා ස්මිදර් සඳහන් කරයි. ඒ සඳහා ඔවුන් ඉදිරිපත් කරන කරුණු අතර, විශාල කණු ප්‍රමාණයක් නොවීම, කණු උස එකිනෙකට අසමාන වීම, සිහින් වීම, කණු මුදුන්වල කුඩුම්බි නොවීම ආදිය දක්වා ඇත. එහෙත් බෙල්, හෙන්රි පාකර්,හෝකාර්ට්, ආනන්ද කුමාරස්වාමි වැනි අය මෙහි පියස්සක් පවතින්නට ඇතැයි අදහස් දක්වා ඇත. පරණවිතාන දක්වන පරිදි ගුන්තු පල්ලි පියස්සේ හැඩයට මෙහි පියස්ස සමානවන්නට ඇති බව අදහස් දක්වයි. මෙහි වහලය කැණිමඬලක හැඩයෙන් යුක්ත වන්නට ඇති බවත් පැතලි උළු වසා තිබූ බවත් දක්වයි.

මෙයට අමතරව තවත් වැදගත් වටදාගෙයක් ලෙස පොළොන්නරුව වටදාගේ දැක්විය හැකි වේ. පළමු පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) විසින් මෙය ගොඩනැගූ බව සැළකේ. පසුකාලීනව නිශ්ශංකමල්ල රජු ද මෙයට එකතු කිරීම් කිහිපයක් කළ බව සඳහන් වේ. මෙහි මධ්‍යයේ වන ස්ථූපයට අමතරව සතර දිශාවට හිඳි බුද්ධ ප්‍රතිමා හතරක් ද තැම්පත් කර තිබී ඇත. ඇතැම් විට එම එක් කිරීම පසුකාලීනව සිදු කරන්නට ඇතැයි උපකල්පනය කළ හැකි වේ. මෙම වටදාගෙයි මළුව ද ද්විත්ව මළුවකින් යුක්ත වේ. ප්‍රධාන ප්‍රවේශයන් ඇතුලුව අනු ප්‍රවේශයන් හතරක් සිව් දිශාවෙන් දැකගත හැකි වේ. මෙම ප්‍රවේශයන් ආශ්‍රිතව අලංකාර සඳකඩපහන්, මුරගල්, කොරවක්ගල් දැකගත හැකි වේ. එසේම අලංකාර මල් කැටයම් ද මේ ආශ්‍රිතව දැකගත හැකි වේ.



පොළොන්නරුව වටදාගේ

## සමෝධානය

ලාංකේය සංස්කෘතියේ වැදගත් වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් ලෙස චෛතියඝර හෙවත් වටදාගේ ලෙස ප්‍රසිද්ධියට පත් නිර්මාණය දැක්විය හැකි වේ. මුල් කාලීනව මෙරට ඉදි වූ කුඩා ස්තූප ආශ්‍රිතව මෙම නිර්මාණය බහුල වශයෙන් හඳුනාගත හැකි වේ. දේවානම්පිය තිස්ස රජු විසින් ඉදිකළ ථූපාරාමය ස්ථූපයේ තැම්පත් කළ බුද්ධ ධාතූන් නිසාවෙන් අසීමිත ගෞරවාදරයට ගත් වූ අතර එම ධාතු වන්දනය හා ස්තූප වන්දනයේ ජනප්‍රියත්වය හා බැතිමතුන්ගේ ශ්‍රද්ධා භක්තිය මෙම වාස්තුවිද්‍යාත්මක නිර්මාණය බිහි කිරීමට හේතු වූ බව උපකල්පනය කළ හැකි වේ. මෙහි උපරිභාග නිර්මාණය කළ ආකාරය පිළිබඳ පැහැදිළි සාධක හඳුනාගෙන නොමැති වුවත් එහි ගල්කණු පිහිටා ඇති ස්වරූපය අනුව මෙහි වහලයේ ස්වරූපය ගොඩනගා ගැනීමට අපහසු නොවේ. අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, ගම්පහ ආදී ප්‍රදේශ තුළින් හඳුනාගත හැකි මෙම නිර්මාණයන්ගේ සාධක එකිනෙකට ආවේනික වූ ලක්ෂණ මෙන්ම වෙනස් ලක්ෂණයන්ගෙන් ද යුක්ත වේ. මෙම නිර්මාණයේ ඇති පොදු ලක්ෂණය යන්නේ චෛතියඝර නිර්මාණය කර ගැනීම සඳහා උස් වූ භූමියක් යොදා ගැනීම වේ.

ඒ මත නිර්මාණ කරනු ලබන ස්ථූපයේ ප්‍රමාණය අනුව චෛතියඝරය සඳහා යොදාගනු ලබන ගල්කණු ප්‍රමාණය හා වට ගණන වෙනස් බව හඳුනාගත හැකි පොදු ලක්ෂණයක් වේ. වර්තමානයේ හොඳින් ආරක්ෂා වී ඇති එකම චෛතියඝරය ගම්පහ අත්තනගල්ල රජමහා විහාරයේ දැකගත හැකි වේ. මුල් කාලීනව නිර්මාණය කරන ලද චෛතියඝර සඳහා පසුකාලීනව නවාංග එක් වීම නිසාත් වෙනස්කම් සිදුවන්නට ඇතැයි උපකල්පනය කළ හැකි වේ. ථූපාරාමය චෛතියඝරය සඳහා බොහෝ රජවරුන් දක්වා ඇති අනුග්‍රහයන් හා සිදු කර ඇති නඩත්තු හා ප්‍රතිසංස්කරණ අනුව ඒ බව මනාව පැහැදිළි වේ. පොළොන්නරුව වටදාගේ හා මැදිරිගිරිය වටදාගේ චෛතියඝර සංකල්පයේ දියුණු අවස්ථා ලෙස දැක්විය හැකි වේ. ඉතා දියුණු ඉදිකිරීම් තාක්ෂණයක් භාවිත කිරීම හා භාවිත අමුද්‍රව්‍යවල ස්වරූපය එයට හේතු වූ බව සිතිය හැකි වේ. එසේම මෙම වාස්තුවිද්‍යාත්මක නිර්මාණය කලාත්මක අංගයක් වශයෙන් ද අගය කළ හැකි වේ.